# ලක්ෂපති කතාව

කැම්පස් එකේ ලක්ෂපතිලා දෙන්නෙක් හිටියා. එක්කෙනෙක් සූරිය-ආරච්චිලාගේ ලක්ෂපති. අනිත් එක්කෙනා, මම්, නිකම් ම නිකම් ලක්ෂපති!

කොහොම ද මම් ලක්ෂපති වුණේ?

ඒක පුංචි කතන්දරයක්. මම් කියන්නම්.

මම ඉස්-ඉස්සෙල්ලා ම කැම්පස් ගියාම, එහේ පුංචි ඡන්දයක් තිබුණා, 'ස්ටුඩන්ට්-යූනියන්' එකට. වෙනත් වචනවලින් කියතොත්, කැම්පස් එකේ ශිෂ්‍ය-සංවිධානයට. ඒ එක්-දහස්-නමසිය-අසූ-ගණන්වල මුල හරියේ. එතකොට ජේ-ආර් රෝහණ විජේවීර ව හිරෙන් මුදා-හැරලා, ආයේ ජේ-වී-පීය තහනම්-කරලා නෑ.

ඔන්න-ඉතින් ඔය ඡන්දය උණුසුම්-වෙද්දී, ඔන්න-ඔය චේ-ගුවේරලා ටිකක් මාව හම්බවෙන්න ආවෙ නැතැයි!

ඇවිත් මොකක් ද දන්නවැයි ඉස්-ඉස්ලේල ම මට කිව් එක?

"ඔහේ ලක්ෂපතියන්ට විරුද්ධයි නේ ද? ලක්ෂපතියන්ට විරුද්ධ ව නැඟී සිටින්ට කැමතියි නේ ද? අප සමග එක්ක වෙන්න, ලක්ෂපතියන්ට එරෙහි ව නැඟී සිටින්න" ඔන්න ඔය විදියට අයියලා ටික කියාගෙන-කියාගෙන ගියා.

එවේලේ මට මොකක් වුණා ද මම කියන්න දන්නේ නෑ. මම ගත්-කටට ම කිව්වා, "අපේ තාත්තාත් ලක්ෂපතියෙක්. ඒ විදියට බලාගෙන ගියා ම තාත්තගේ උරුමක්කාරයෙක් හැටියට, මාත් කවදා හරි ලක්ෂපතියෙක්! ඉතින් ඔහෙලා කියන්නේ මට තාත්තටයි මටයි විරුද්ධ ව නැගී-සිටින්න කියල ද?"

ඇත්ත ම කියතොත් මගේ තාත්ත කරේ වඩු-කර්මාන්තය. අම්මා නිකම් ම නිකම් ගෘහිණියක්. තාත්තයි-අම්මයි අපිත් එක්ක (ඒ කියන්නේ අපි සහෝදර-සහෝදරියන් එක්ක) කවදාවත් මුදල්-හදල් ගැන සාකච්ඡා කරලා තිබුණේ නෑ ඒ-වෙනකොට, සල්ලි නාස්ති-කරන්න එපයි කියලා හැම විට ම කියන එක මිසක්! හැම විට ම! හැබැයි කුඩා-කල සිට ම මිහිර පත්තරේ ලංකාවේ ප්‍රථම ලක්ෂපති 'මැලිබන් මුදලාලි' ගැන ලිපියක් කියවා සිටි "මටත් කවදා හරි ලක්ෂපතියෙක් වෙන්න ඇත් නම්!" යන සිතුවිල්ල මගේ සිතට තදින් ම කා-වැදිලා තිබුණා! ඒ හින්දා වෙන්නැති මම එහෙම කිව්වේ. කොහොම වුණත් මම එදා ඉඳලා කැම්පස්-එකේ ලක්ෂපති!

ඉතින් ඔහෙලා අහන්න ඇහැකි තව ප්‍රශ්නයකට, අහන්න ඉස්සෙල්ලා ම මම උත්තර දෙන්නම්. කැම්පස් එකේ ගණාධිකරණයයි - කළමනාකරණයයි හැදෑරූ මම, කැම්පස් එකෙන් උපාධිය ලැබුණාට පසුව තාත්තගේ වඩු-කර්මාන්තයන්ට ම එකතු වුණා. ඒකෙන් හොඳ ආදායමක් තියෙනවා විතරක් නොවේ, මට ලොකු තෘප්තියක් (ජොබ්-සැටිස්ෆැක්ෂන්-එකක්) තියෙනවා. ඒ විතරක් නොවේ, අපේ මුළු වාර්ෂික ආදායමයි - වර්ක්-ඉන්-ස්ටොක්-වුයි ගත්තා ම, එදයි-අදයි උද්දාමය නිසා ආදායම්වල සිදුවෙන වෙනස්කම්වලට ගණන්-නොහැදුවොත්, අපි ඔක්කොම ලක්ෂපතියෝ නොවෙයි, කෝටිපතියෝ!

ඇරත් අද ලක්ෂයක බැංකු අරමුදලෙන් ලැබෙන පොළියෙන් ජීවත්-වෙන්න හදන මිනිහට අඩු තරමින් මාසෙකට රුපියල්-දෙදාහක ආදායමක්වත් ලැබෙනවා ද? අනිත් අතට, රුපියල් දෙදාහකින් උනත් ගන්න ඇහැකි කෑම මොනවා ද? ඉතින් මම ලක්ෂපති වුණා ම ඇති වරද මොකක් ද? ඔන්න ඕක තමයි මගේ ලක්ෂපති කතන්දරේ කියලා කියන්නේ!

ලියන්නේ ප්‍රියන්ති වික්‍රමසූරිය

(මිතුරෙකුගේ කතාව ඇසුරෙනි)

අවසාන සංස්කරණය: 29 නොවැම්බර 2012